

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# *කාර්යය සාධන වාර්තාව 2016*




## “ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි”

**පළාත් ආදායම්දෙපාර්තමේන්තුව**
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

දු.ක. 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් :info@revenuedept.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenuedept.cp.gov.lk

## තත්ත්ව විශ්ලේෂණය

මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් ප්‍රධානම ආදායම් ප්‍රභවය වූ පිරිවැටුම් බද්ද අත්හිටවූ අතර,වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිග හිටි බදු පමණක් අයකර ගැනීම සිදුවේ.2017 වර්ෂය අවසාන වන විට හිග හිටි පිරිවැටුම් බදු ශේෂය 0 (බිංදුව)කරා ළඟාවීම දෙපාර්තමේන්තුවේ අරමුණයි.පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමගම අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය බවට පත්වන්නේ මුද්දර ගාස්තුවයි.ඊට අමතරව 2014-04-01 සිට බනිජ අයිතීන් පිළිබඳ බද්ද ද, බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 2015 නොවැම්බර් මාසයේ සිට ද ක්‍රියාත්මක වේ.මුද්දර ගාස්තු ආදායම සමස්ථ ආදායමෙන් 99 %ක් වන අතර, ඉතිරි ප්‍රමාණය අනෙකුත් ආදායම්ප්‍රභවයන්ගේ දායකත්වය යි.

වර්තමානයේ මධ්‍යම රජයේ බදු අය කිරීමේ ක්‍රමවේදය වඩාත් පුළුල් කර ඇති බැවින් සාමාන්‍ය මහජනතාව වෙත පීඩනයක් ඇති නොවන පරිදි,පළාතේ ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා නව ආදායම් ප්‍රභවයන් සොයා ගැනීමත් ඒවා අනුමත කර ක්‍රියාත්මක කිරීමත් ප්‍රබල අභියෝගයක්ව ඇත.

මධ්‍යම පළාත් සභාවේ ඵලදායිතාවය නංවාලීමේ අරමුණින් 2012 වසරේදී සකස් කෙරුණු උපායශීලි සැලසුමට අනුව පළාතේ එක් දෙපාර්තමේන්තුවක් ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ද ක්‍රියාකාරි දායකත්වය සැපයීමේ අරමුණ පෙරදැරි කරගෙන එම උපායශීලි සැලසුමේම කොටසක් ලෙස අප දෙපාර්තමේන්තුවේ 2016වර්ෂයට අදාල අරමුණු හා උපායයන් සකස් කෙරිණි.

## ආදායම් ඉලක්කය 2016 වර්ෂය

| ආදායම් ප්‍රභවය | | දෙපාර්තමේන්තු ඉලක්කය රුපියල් |
|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,188,000,000 |
| 02 | හිග පිරිවැටුම් බදු | 3,000,000 |
| 03 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද | 3,500,000 |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>1. ඇප තැන්පතු (බලපත්‍ර 100)*<br>2. බලපත්‍ර ගාස්තු (බලපත්‍ර 100) | <br>10,000,000<br>500,000 |
| 05 | ඔට්ටු බද්ද | 175,000 |
| | එකතුව | 1,195,175,000 |

(* බඩු උකස් ගන්නන් විසින් කරන ලද ඇප තැන්පතු, ආදායමක් ලෙස සැළකිය නොහැකි අතර එය වගකීමකි.)

පළාත් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය හා පළාත් ආදායම් දෙපාර්තමේන්තුඉලක්කය යන දෙකම සැලකිල්ල ට ගෙන ඉහත පරිදි ඉලක්ක සකස් කරන ලදී. පිරිවැටුම් බදු පැනවීම අත්හිටුවා ඇති අතර අයකර ගැනීමට ඇති මුළු හිග පිරිවැටුම් බදු ප්‍රමාණයද රුපියල් මිලියන 40 ට අඩුය. මෙම ප්‍රමාණය තුළ ද නීතිපති උපදෙස් විමසා ඇති මුත් මෙතෙක් පිළිතුරු නොලද රු.මිලියන 15 ක් ද, ව්‍යාපාර හා පුද්ගලයින් නොමැති නිසා කපාහැරීමට යෝජිත රු.මිලියන 16 ක් ද ඇත. එනිසා පිරිවැටුම් බදු සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය ප්‍රායෝගිකනොවේ.

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව(මධ්‍යම පළාත)

**දැක්ම**

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

**<u>මෙහෙවර</u>**

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත්වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**<u>වටිනාකම</u>**

1. පරිපූර්ණත්වය
2. වෘත්තීය දක්ෂකම
3. කැපවීම
4. සහයෝගීත්වය

**<u>පරමාර්ථ / අරමුණු</u>**

1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම
2. නව ආදායම් උත්පාදන මූලාශ්‍ර පිළබඳ පර්යේෂණ හා සංවර්ධනය
3. වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම
4. තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම
5. යහපාලනය

## 2016 වර්ෂයතුළදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය

| ආදායම් ප්‍රභවය | | වාර්ෂික ආදායම් ඉලක්කය රුපියල් | *2016* වර්ෂය තත්‍ය ආදායම රුපියල් | ළඟා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,188,000,000 | 1,642,042,811 | **138%** |
| 02 | හිඟ පිරිවැටුම් බදු | 3,000,000 | 5,005,807 | **167%** |
| 03 | ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද | 3,500,000 | 3,986,437 | **114%** |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>1. ඇප තැන්පතු<br>2. බලපත්‍ර ගාස්තු<br>3. ලියාපදිංචි ගාස්තු | <br>*10,000,000<br>500,000<br> | <br>*13,800,000<br>1,130,000<br>800,000 | <br>**138%**<br>**226%**<br> |
| 05 | ඔට්ටු බද්ද | 175,000 | 51,047 | **29%** |
| | එකතුව | 1,205,175,000 | 1.666,816,102 | **138%** |

(* බඩු උකස් ගන්නන් විසින් කරන ලද ඇප තැන්පතු, ආදායමක් ලෙස සැළකිය නොහැකි අතර එය වගකීමකි.ඔට්ටු බද්ද ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින නීති රාමුව තුළදෙපාර්තමේන්තුවට කටයුතු කළ නොහැකි අතර, පුද්ගලයින් අල්ලන ඔට්ටු මත බදු අයකර ගැනීම සිදු වේ.)


### 1. 2016වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1188 ක් එකතු කිරීම

වර්තමානයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය මුද්දර ගාස්තු ආදායම වන බැවින් පළාත් අයවැය දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් ඉහත ඉලක්කය වෙත ළඟා වීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ආරම්භයේ සිටම මනා සැලැස්මක් ඇතිව කටයුතු කළ අතර, දෙපාර්තමේන්තුවේ වැඩ බෙදාහැරීමේදී මුද්දර අංශය වෙත වැඩි අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව පෙර වර්ෂයට වඩා රුපියල් **ලක්ෂ2990**ක වර්ධනයක් කරා ළඟා කර ගනිමින් වර්ෂයේ ඉලක්ක ගත මුද්දර ආදායම**138%** ක වර්ධනයක් සමග ඉලක්ක කරාළඟා වීමට දෙපාර්තමේන්තුවටහැකි විය.

මුද්දර ගාස්තු ආදායම ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවූයේ, පිරිවැටුම් බදු පැනවීම අත්හිටුවීමත් සමඟ නිලධාරීන්ගෙන් වැඩි ප්‍රමාණයක් මුද්දර ගාස්තු ගෙවීම් පරීක්ෂා කිරීම සඳහා යෙදවීමෙනි. ඊට අමතරව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් සියළු තොරතුරු ලබා ගෙන දේපල පිහිටි ස්ථාන පරීක්ෂා කිරීම වැඩි කිරීමත්. නිලධාරීන්ට දේපල තක්සේරුකරණය පිළිබඳ වැඩි දුරටත් දැනුම වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන් පවත්වා ඒ තුළින් ප්‍රගතිය අත්කර ගැනීමටද කටයුතු කර ඇත. මුලින්ම මාණ්ඩලික නිලධාරීන්ට ආදායම් ඉලක්ක ලබා දුන් අතර ඔවුන්ගේ එම ආදායම් ඉලක්ක වෙත ළඟාවීමේ ප්‍රගතිය මාසික වාර්තාවක් සේ ප්‍රධාන ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.2016 වර්ෂය තුළ රැස්කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම රු. **93,358,963**/-කි. එකී මුදල රැස් කිරීමට කටයුතු කර ඇත්තේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සෘජු මැදිහත්වීමෙන් සහ දේපල පිහිටි ස්ථාන පරීක්ෂා කර, දෙපාර්තමේන්තුවට පුද්ගලයින් කැඳවා අවශ්‍ය අවස්ථාවන් හි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ද ලබා ගෙන සියළු තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව කටයුතු කිරීම මගින් ය.තවද. දේපලක් මිලදී ගැනීමේදී එහි නියම වෙළඳපොල වටිනාකම සඳහන් කිරීම මඟින් අදාල දේපලට නියම වටිනාකමක් ලැබෙන බව නොතාරිස්වරුන් හරහා දේපල මිලදීගන්නන් දැනුවත් කිරීම, කාර්යය මණ්ඩලයේ ක්ෂේත්‍රයේ පලපුරුද්ද හා වෘත්තීය නිපුනතා වැඩිදියුණු කර ගැනීම මඟින් නිවැරදි තක්සේරුකරණය වෙළඳපොල වටිනාකම මත සාධන පත්‍ර ලිවීමට හේතු විය. එමෙන්ම,වෙළඳපොළ වටිනාකම මත මුද්දරගාස්තු ගෙවීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් නොතාරිස්වරුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳව නිරන්තර අධීක්ෂණය නිසා නියමිතවටිනාකම මත මුද්දරගාස්තු ගෙවීමේ යහපත් ප්‍රවනතාවයක් දිනෙන් දින වර්ධනය වෙමින් පවතී.

| මුද්දර ගාස්තු ආදායම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ආදායම රු. | වර්ධනය % |
| 2010 | 440,000,000 | 481,000,000 | |
| **2011** | **368,000,000** | **684,335,872** | 42% |
| **2012** | **725,000,000** | **827,681,905** | 21% |
| **2013** | 850,000,000 | 862,749,671 | 4% |
| **2014** | 875,000,000 | 1,072,465,077 | 24% |
| **2015** | 880,000,000 | 1,342,990,172 | 25% |
| **2016** | 1,188,000,000 | 1,642,042,811 | 22% |

| අතිරේක මුද්දර ගාස්තු ආදායම | |
|---|---|
| වර්ෂය | ආදායම රු. |
| 2010 | 838,308 |
| 2011 | 16,527,044 |
| 2012 | 53,011,739 |
| 2013 | 71,011,329 |
| 2014 | 81,942,257 |
| 2015 | 93,919,500 |
| **2016** | **93,358,963** |




තවද නිශ්චල දේපලක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන අවස්ථාවේ දී ම එම දේපලෙහි නියමිත වෙළඳපොළ වටිනාකම මත මුද්දර ගාස්තු අය කිරීමේ අරමුණ ඇතිව 2013 වර්ෂයේ සිටආරම්භ කරන ලදවැඩ පිළිවෙළමඟින් ඔප්පුවක් ලියන පළමු අවස්ථාවේදී ම අදාල දේපල පිළිබඳ තොරතුරු අප දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඒවා පරීක්ෂාවට ලක්කර නියමිත වෙළඳපල වටිනාකම අනුව දේපල තක්සේරුකර, අප දෙපාර්තමේන්තුවේ මතය ලබාදීමට ක්‍රියා කිරීම තුළින් නියමිත මුද්දර ගාස්තු මුල් අවස්ථාවේ දී ම අය කිරීමට හැකිවන නිසා පළාත් සභාවට වැඩි ආදායම් ප්‍රමාණයක් අප්‍රමාදව ලබා ගැනීමට ද හැකිවී තිබේ. මේ නිසාවෙන් ඌන මුද්දර ගාස්තු සඳහා තක්සේරු දැන්වීම් නිකුත් කිරීම අඩු වූ අතර, ප්‍රභවයේදීම නියමිත බද්ද අයකර ගැනීමට හැකි විය. 2016 වර්ෂයේ දී මෙසේ නිකුත් කරන ලද තක්සේරු වාර්තා ගණන **968**කි.

**2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 3ක් එකතු කිරීම**

2011-01-01 දින සිට පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමඟම 2010 (4) කාර්තුව දක්වා වූ කාලය සඳහා බදු ගෙවිය යුතු ව්‍යාපාරවල ද බදු ගෙවීමේ අනුකූලතාවය විශාල වශයෙන් පහත වැටීමක් දක්නට ලැබිණි. එසේ වුවද, 2011 වර්ෂයට පෙර කාර්තු සඳහා පිරිවැටුම් බදු වාර්තා නොසපයන ලද ව්‍යාපාර වෙනුවෙන් තක්සේරු දැන්වීම්, රතු නිවේදන නිකුත් කරමින් සහ අනෙකුත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන

අතරතුර, ලිපිගොනු නිරන්තරයෙන් පසු විපරම් කරමින් ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම නිසා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු හිග ආදායමෙන් වැඩි ප්‍රමාණයක් රැස් කර ගැනීමට හැකිවිය.

ඒ අනුව 2016 වර්ෂයට ඉලක්කගත කළ හිග පිරිවැටුම් බදු ආදායම වන රු.3,000,000/- වෙනුවට වර්ෂය තුළ රුපියල් **5,005,807** ක් රැස් කරන ලද අතර, එය වාර්ෂික ඉලක්කය**167%**කින් ලගාකර ගැනීමකි. ඒ සඳහා නඩු පැවරීම් 30 ක් ද, දේපල තහනමට ගැනීමේ නිවේදන සමග ස්ථාන පරීක්ෂණ 64ක් ද කිරීමට කටයුතු කර ඇත. තවද, හිග පිරිවැටුම් බදු ශේෂය 2016-12-31 දින වන විට රු. මිලියන 33.9ක් දක්වා අඩුකර ගැනීමට හැකිව ඇත. මෙම ශේෂය තුළ 2010-12-31 දින දක්වා වූ හිග පිරිවැටුම්බදුවලින් ගොනු තුනක ට අදාලව රුපියල් 15,950,098 ක් සඳහා නීතිපති උපදෙස් විමසා ඇති අතර, උපදෙස් ලැබෙන තෙක් තාවකාලිකව නැවත වතාවක් පවතින නීතිමය රාමුව තුල වූ කටයුතු (විගණන උපදෙස් මත) උපායමාර්ගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කරනලදී. එයින් එක් ආයතයක් වාරික ලෙසතම හිග බදු ප්‍රමාණයගෙවීමට එකගකරවා ගැනීම නිසා වර්ෂික ඉලක්කය ද ඉක්මවා ආදයම රැස් කර ගැනීමට හැකිවිය. තවද, අයකර ගත නොහැකි රුපියල් මිලියන 16 ක බදු ප්‍රමාණයක් කපා හැරීමට අනුමැතිය සඳහා විස්තරාත්මක වාර්තාවක් කරන ලදුවඇත ද මෙතෙක් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැත.

### 3. ඛනිජ අයිතීන් පිළිබඳ බද්දරුපියල් මිලියන 3.5ක් එකතු කිරීම

2016 වර්ෂයට ඉලක්කගතඛනිජ අයිතීන් පිළිබඳබදු ආදායම වන රු.3,500,000/- වෙනුවට වර්ෂය තුළ රුපියල් 3,986,437 ක් රැස් කරන ලද අතර, එය වාර්ෂික ඉලක්කය **114%**කින් ලගාකර ගැනීමකි.මෙම බද්ද ආදාල ව්‍යාපාර ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට අළුත් බද්දක් වීම, පොදුවේ බදු සම්බන්ධව අඩු දැනුම හා බදු සම්බන්ධව ඇති ආකල්ප හේතුවෙන් මෙම ඉලක්කය ළගා කර ගැනීම සඳහා වැඩි වශයෙන් ක්ෂේත්‍ර සමීක්ෂණ, ස්ථාන පරීක්ෂණ හා දැනුවත් කිරීමේ කටයුතු කිරීමට සිදු විය. වාර්තා නොසැපයීම මතනඩු පැවරීම් 30 ක් ද සිදු කරන ලදී.

### 4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම්

පළාත් අයවැය දෙපාර්තමේන්තුව ලබා දුන් **රුපියල් ලක්ෂ3**ක ඉලක්කය වෙනුවට පළාත් ආදායම් දෙපාර්තමේන්තුඉලක්කයලෙස 1. ඇප තැන්පතු රු. 10,000,000 ක් හා 2. බලපත්‍ර ගාස්තු රු. 500,000 ක් ලෙස **රුපියල් මිලියන 10.5** ක් ඉලක්ක කළ අතර, වර්ෂය තුළඇප තැන්පතු රු. 13,800,000ක්,බලපත්‍ර ගාස්තුරු. 1,130,000 ක් හා ලියාපදිංචි ගාස්තු ලෙස රු. 800,000 ක් එකතු කර ඉලක්කය **149%**කින් ලගාකර ගනිමින් වර්ෂයේ ඉලක්කගත ආදායම ඉක්මවීමට දෙපාර්තමේන්තුවටහැකි විය. 2016 වසරට අදාලව බලපත්‍ර ලබා ගැනීමේදී බඩු උකස් ගන්නන් සියලු දෙනා විසින්ම ඇප තැන්පතු තැන්පත් කර ඇති අතර, නව ව්‍යාපාරිකයන්සියලුදෙනා විසින්දඇප තැන්පතු වලට අමතරව ලියාපදිංචි ගාස්තු ද ගෙවා අවසන් ය. ඉදිරි කාලයේදීවාර්ෂික බලපත්‍ර ගාස්තු මේ යටතේ ප්‍රධාන ආදායම වනු ඇත.

### 5.නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද 2014-04-01 සිට අයකිරීම සිදුවේ. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය2015 ඔක්තෝබර් මාසයේ දීසම්මත විය. පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර,මෙතෙක් අනුමත වී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව

### 6. තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම

බදු හා ගාස්තු සම්බන්ධයෙන් තෙවන පාර්ශ්වය දැනුවත් කිරීමට හා ගෙවීමේ පහසුකම් වැඩි දියුණු කිරීමට වෙබ් අඩවියක් ආරම්භ කරන ලද අතර, එය යාවත්කාලීනව පවත්වාගෙන යයි.

# 2016 ක්‍රියාකාරී සැලසුම අනුවකාර්ය සාධනය

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළඟාවීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය<br>**රු.මිලි.1188** | | **රු.මි 1188** | **රු.මි.1642** |
| | | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු, අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරීම<br>3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරීම | 25000 | 29190 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරීම | 6000 | 7422 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 6000 | 9164 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරීම. (ආකෘති පත්‍ර 300,101 හා 226 මඟින්) | 6500 | 10304 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරීම.<br>ii. මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකඟ නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.70 | රු.මිලි.93 |
| | | iii. දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ස්ථාන පරීක්ෂණ සංඛ්‍යාව. | 1200 | 1483 |
| | | iv. සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම් ගොනු සංඛ්‍යාව | 5000 | 4386 |
| | | 9. තක්සේරු දැන්වීම් නිකුත් කිරීම සහ තක්සේරු සහතික (මතය) නිකුත් කිරීම | 1500 | 1401 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | |
| | | 11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 15 | 11 |
| | | 12. තොරතුරු නොසැපයීම මත නීතිමය පියවර ගැනීම | | 43 |
| | ඛනිජ අයිතීන් පිළිබඳබදු අංශය<br>**රු.මිලි.3.5** | | **රු.මි.3.5** | **රු.මි.3.9** |
| | | 1. ඛනිජ බදු වාර්තා නිකුත් කිරීම | 3000 | 3681 |
| | | 2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරීම | 3000 | 1187 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරීම | 1500 | 3340 |
| | | 4. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරීම | 50 | 35 |
| | | 5.ඛනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීමට වැඩසටහනක් සකස්කර සියළුම ගෙවීම්පත් පරිගණකගත කිරීම. | **සියල්ලම** | ඉටු කර ඇත |
| | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය ගාස්තු හා තැන්පතු<br>රු.මිලි.10.5 | 1. ඇප තැන්පතු | රු.මිලි.10 | රු.මි.13.8 |
| | | 2. වාර්ෂික බලපත්‍ර ගාස්තු හා නව ලියාපදිංචි ගාස්තු | රු.මි.0.5 | රු.මි.1.93 |

| | | | | |
|---|---|---|---|---|
| | අය හා හිඟ බදු අංශය<br><br>හිඟ පිරිවැටුම් රු.මිලි. 3 | 1. අභියාචනා /විරෝධතා විසඳීම - ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම<br>2. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු/ ගාස්තු එකතු කිරීම (D 7)<br>3. නොගෙවූ හා එකගතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම.<br>4. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරීම<br>5. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | සියල්ලම<br><br>250<br>50<br><br>සියල්ලම | ඉටු කර ඇත<br><br>221<br>30<br><br>ඉටු කර ඇත |
| 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම<br>3. එම එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් උපයාගත හැකි ආදායම හඳුනාගැනීම<br>4. ක්‍රියාත්මක කිරීමට වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>5. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනා අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම | | යෝජනා 2ක් විට ඉදිරිපත් කර ඇත. |
| 3. කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම<br>4.පිරිවැය හඳුනාගැනීම. | පුහුණු වැඩමුළු 22කට සේවා අවශ්‍යතා අනුව නිලධාරීන් සහභාගී කර ඇත | |
| 4. තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය | | 1. කාර්යක්ෂම, ආරක්ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම | | ඉටු කර ඇත |
| 5. තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීම් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් පළ කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | | ඉටු කර ඇත |
| 6. යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | ඵලදායිතා විශේෂ කුසලතා සම්මාන දිනා ගැනීම | |

ඉහත සියලුම දත්තයන් ලබා ගන්නා ලද්දේ නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරීමෙනි.

**විශේෂ ජයග්‍රහණ**

2016 වර්ෂයේදී පැවති, 2015 වර්ෂය සඳහා වූ ඵලදායිතා තරගාවලියේ දී පළාත් අංශයෙන් ඵලදායිතා විශේෂ කුසලතා සම්මානය දිනා ගැනීම අප දෙපාර්තමේන්තුව ලද විශේෂ ජයග්‍රහණයකි.

මීට අමතරව අපගේ ප්‍රගතිය වර්ධනය කර ගැනීම සඳහා මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරුදෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමිය,ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

2016 වසරේ දී මෙන්ම 2017 වර්ෂයේ දී ද අපගේ ක්‍රියාකාරී සැලැස්ම තුළින් ඉදිරිපත් කරනු ලබන ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීමට අපි ඇප කැප වෙමු.

**ස්තුතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)

පළාත් ආදායම් කොමසාරිස්

මධ්‍යම පළාත